# கிழக்கு மாகாண சபை

# නැගෙනහිර පළාත් සභාව

# Eastern Provincial Council

ස්ථානය : පළාත් සභා මණ්ඩපය

දිනය : 2013 සැප්තැම්බර් මස 30

වේලාව : පෙ.ව. 09.30

**01. 2013 අංක 01 දරණ නැගෙනහිර පළාත් නිවාස ඉදිකිරීම් අධිකාරියේ ප්‍රඥප්තිය**
(ගරු මාර්ග සංවර්ධන අමාත්‍ය එම්.එස්. උදුමාලෙබ්බේ මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කිරීම)

**02. ප්‍රශ්න**

| | | |
|---|---|---|
| 2.1 | ගරු දයා ගමගේ මැතිතුමා | - නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී |

**03. පුද්ගලික යෝජනා**

| | | |
|---|---|---|
| 3.1 | ගරු එම්. එස්. එස්. අමීර් අලි මැතිතුමා | - නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී |
| 3.2 | ගරු ඒ. එල්. තවම් මැතිතුමා | - නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී |
| 3.3 | ගරු එම්. එස්. සුබයිර් මැතිතුමා | - උපසභාපති, නැගෙනහිර පළාත් සභාව |
| 3.4 | ගරු දයා ගමගේ මැතිතුමා | - නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී |
| 3.5 | ගරු දයා ගමගේ මැතිතුමා | - නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී |
| 3.6 | ගරු දයා ගමගේ මැතිතුමා | - නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී |
| 3.7 | ගරු මන්ත්‍රී කේ. නාගේස්වරන් මැතිතුමා | - නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී |
| 3.8 | ගරු මන්ත්‍රී ඒ. මොහමඩ් ජමීල් මැතිතුමා | - නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී |

කේ. කරුණාහරන්
ලේකම්
සභා ලේකම් කාර්යාලය
නැගෙනහිර පළාත් සභාව.

2013.09.17

## 01. 2013 අංක 01 දරණ නැගෙනහිර පළාත් නිවාස ඉදිකිරීම් අධිකාරියේ ප්‍රඥප්තිය

(ගරු මාර්ග සංවර්ධන අමාත්‍ය එම්.එස්. උදුමාලෙබ්බේ මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කිරීම)

## 02. ප්‍රශ්න

### 2.1 ගරු දයා ගමගේ මන්ත්‍රීතුමා - නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී

(ගරු ප්‍රධාන අමාත්‍ය, නජීබ් අබ්දුල් මජීඩ් මැතිතුමාගෙන් පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න)

අ. 2013 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව අම්පාර, මඩකලපුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන් හි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති වෙන් වෙන් වශයෙන් කවරේ ද? යන්නත්,

ආ. ඒ එක් එක් ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුදල කොපමණ ද? යන්නත්,

ඇ. ඒ එක් එක් ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල කොපමණ ද? යන්නත්,

ඈ. ඒ එක් එක් ව්‍යාපෘතියට අදාල කොන්ත්‍රාත්තුව කරන ලද ආයතනය කුමක් ද? යන්නත්,

ඉ. ඒ එක් එක් ව්‍යාපෘතියේ වර්ථමාන තත්වය කවරේ ද? යන්නත්,

වෙන් වෙන් වශයෙන් මේ සභාවට දැනුම් දෙන ලෙස ඉල්ලමි.

## 03. පුද්ගලික යෝජනා

### 3.1 ගරු එම්. එස්. එස්. අමීර් අලි මැතිතුමා - නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී

**කෝරලේ පත්තු දකුණ (කිරාන්) යන නමින් නව ප්‍රාදේශිය සභාවක් ඇති කිරීම**

මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරලේ පත්තු දකුණ (කිරාන්) යැයි සඳහන් කරනු ලබන නව ප්‍රාදේශිය සභාවක් ඇති කිරීම සම්බන්ධයෙන් මඩකලපු දිස්ත්‍රික් පළාත් පාලන කොමසාරිස් විසින් නිවේදනයක් නිකුත් කර ඇත.

ඉහත නිවේදනය අනුව කෝරලේ පත්තු බටහිර (ඔට්ටමාවඩි) ප්‍රාදේශිය සභාව යටතේ දැනට පාලනය වන ඇතැම් ග්‍රාම සේවා කොට්ඨාශ ඇතුළත් වන සේ සීමා මායිම් තීරණය කිරීමට විධිවිධාන සලසා ඇත.

2002 වර්ෂයේ ඇති කරන ලද කෝරලේ පත්තු දකුණ (කිරාන්), කෝරලේ පත්තු මධ්‍යම (වාලච්චේනෙයි) යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ දෙක සඳහා ද සීමා මායිම් තීරණය නොකර දීර්ඝ කාලයක් තිස්සේ කල් යමින් පවතී.

පසුගිය කාලය තුළ ඉහත කී ප්‍රාදේශ දෙක සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රාදේශිය සභා පිහිටුවීමට ගත් උත්සහයට ද දෙපාර්ශවයේ එකඟතාවයක් නොතිබුණි.

මෙවැනි පසුබිමක් මත මෙම නිවේදනය හේතුවෙන් ද ජන කොටස් දෙක අතර ප්‍රශ්න ඇති වීමට ඇති ඉඩකඩ අධික බව සභාව ඉදිරියේ දන්වා සිටිමි.

ඉහත කී ගැටුම්කාරි තත්ත්වය සමතයකට පත් වන තුරු කෝරලේ පත්තු දකුණ (කිරාන්) ප්‍රාදේශිය සභාව ඇති කිරීම තාවකාලිකව අත්හිටුවිය යුතුයි. එසේම මේ පිළිබඳව නිවේදනය අදාල පාර්ශවයන් වෙත වහාම දැනුවත් කිරීමට සභාවෙන් ඉල්ලා සිටිමි.

### 3.2 ගරු ඒ. එල්. තවම් මැතිතුමා - නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී

**අක්කරෙයිපත්තු කලාප අධ්‍යාපන කාර්යාලයේ සිදුවන අක්‍රමිකතා**

අක්කරෙයිපත්තු කලාප අධ්‍යාපන කාර්යාලයේ අක්‍රමිකව සිදුවන ස්ථාන මාරු හා ගුරු තුලනය කිරීම සම්බන්ධයෙන් පක්ෂපාතීව කටයුතු කිරීම හේතුවෙන් ගුරුවරු හා විදුහල්පතිවරු මානසික පීඩනයට ලක්ව සිටී. මෙවැනි අසීරු තත්ත්වයන් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු වලට ද බලපා ඇත. මේ සම්බන්ධයෙන් වහාම විසඳුම් ලබා දෙන ලෙස අදාල දෙපාර්තමේන්තුව හා ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කරමි.

**3.3 ගරු එම්. එස්. සුබයිර් මැතිතුමා - නියෝජ්‍ය සභාපති, නැගෙනහිර පළාත් සභාව**

**<u>නැගෙනහිර පළාතේ සේවය කරන විදුහල්පතිවරු හා ගුරුවරුන්ට හජ් වන්දනාව සඳහා විදෙස්ගත වීමට වැටුප් රහිත එතෙර නිවාඩු අනුමැතිය ලබා ගැනීම</u>**

නැගෙනහිර පළාතේ සේවය කරන විදුහල්පතිවරු හා ගරුවරුන් හජ් වන්දනා ගමන් යාමේදී නිවාඩු ඉල්ලුම්පත් ඉල්ලා සිටින විට එකතු කරගත් අසනීප නිවාඩු නැති අයට වැටුප් රහිත නිවාඩු ලබාදී ඔවුන්ට හජ් වන්දනාව ගමන් යාමට අනුමැතිය ලබාදිය යුතුයි.

**3.4 ගරු දයා ගමගේ මැතිතුමා - නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී**

නැගෙනහිර පළාත් සභාවට අයත් අම්පාර මඩකලපුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන් හි පළාත් සභා විෂය පථයට අදාලව සිදු කරනු ලබන සංවර්ධන කටයුතු පිළිබඳව පහත තොරතුරු ද පළාත් පාලන ආයතන / දෙපාර්තමේන්තු / අදාල ආයතන මට්ටමින් වෙබ් අඩවියට ඇතුළත් කිරීමට යෝජනා කරමි.

- ව්‍යාපෘතියේ ස්වභාවය
- ප්‍රතිපාදන සපයනු ලබන ආයතන
- ඇස්තමේන්තු ගත මුදල
- කොන්ත්‍රාත්කාර ආයතනය
- කොන්ත්‍රාත් කාලසීමාව

**3.5 ගරු දයා ගමගේ මැතිතුමා - නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී**

නැගෙනහිර පළාත් සභාව යටතට ගැනෙන අම්පාර මඩකලපුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන් තුළ ඉටු කරනු ලබන සියලුම කටයුතු මෙම සභාවේ මැදිහත් වීම මත සිදු විය යුතු අතර පළාත් සභා විෂය පථයට අයත් නොවන කටයුතු වලදී අවම වශයෙන් ඒ පිළිබඳව මෙම සභාව දැනුවත් විය යුතු බවට අදාල අංශ දැනුවත් කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

**3.6 ගරු දයා ගමගේ මැතිතුමා - නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී**

පළාත් සභාව මගින් යෝජනා ඉදිරිපත් කිරීමේදී කිසිදු භේදයකින් තොරව සියළුම පක්ෂ නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරුන්ගේ යෝජනා ලබා ගැනීම.

**3.7 ගරු මන්ත්‍රී කේ. නාගේස්වරන් මැතිතුමා - නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී**

**<u>සරණාගත කඳවුරුවල ජීවත්වන සාම්පූර් ජනතාව නැවත පදිංචි නොකිරීම හා ඔවුන්ගේ වියළි සලාක නවතා තිබීම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ යෝජනාව</u>**

ඉකුත් අවුරුදු 07 කට වැඩි කාලයක් සරණාගත කඳවුරුවල ජීවත්වන සාම්පූර් ජනතාව නැවත පදිංචි කිරීම සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති හෙයින් හා ඉකුත් 2011 දෙසැම්බර් මාසයේ සිට ඔවුන්ට වියළි සලාක ලබා දීම සම්පූර්ණයෙන්ම නවත්වා තිබීම හේතුවෙන් ඔවුන්ට මුහුණ පෑමට සිදුව ඇති දුෂ්කරතා පිළිබඳව අවධානය යොමු කොට, අත්පත් කරගෙන මායිම්වැට සාදා ඇති ප්‍රදේශයෙන් පිට සාම්පූර් ජනතාවට අයිති අක්කර දහස් ගණන් කුඹුරු ඉඩම්වල ඔවුන්ට ගොවිතැන් කිරීමට අවසර ලබා නොදීම සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු කොට, සභාව වෙනුවෙන් කණගාටුව පළ කිරීමටත්, ඒ සඳහා ක්‍රියාකාරී වැඩපිළිවෙළක් දියත් කිරීමත් සඳහා ඉදිරිපත් කරන මෙම යෝජනාව ස්ථිර කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

**3.8 ගරු මන්ත්‍රී ඒ. මොහමඩ් ජමීල් මැතිතුමා - නැගෙනහිර පළාත් සභා මන්ත්‍රී**

**<u>13 වන සංශෝධන පනත</u>**

පළාත් සභා ක්‍රමය තුළින් ශ්‍රී ලංකාවේ ජනතාව තම පළාත් මට්ටමේ අවශ්‍යතාවයන් ඒ ඒ අවස්ථාවන් වලදී ඉටුකර ගැනීමට බලය ලබාදී ඇත.

සියලුම පක්ෂ නියෝජිතවරුන්ගේ සමුළුවේ අභ්‍යන්තර වාර්තාවෙන් පසු 2008.05.10 දින පැවැති නැගෙනහිර පළාත් සභා මැතිවරණයක් මගින් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් ප්‍රථම වරට නැගෙනහිර පළාත් සභාව විවෘත කරන ලදී.

නැගෙනහිර පළාත් සභාවේ මුස්ලිම්, දෙමළ, සිංහල ජනතාව අවස්ථා දෙකකදී තම නියෝජිත පිරිස මැතිවරණ මගින් තෝරාගෙන නැගෙනහිර පළාත් සභාවට එවා ඇත.

නැගෙනහිර පළාත් සභාවට මුස්ලිම්, දෙමළ, සිංහල මහජන නියෝජිතවරු තෝරා ගන්නා ලද අතර, ප්‍රධාන අමාත්‍යවරයා හා අනෙකුත් අමාත්‍යවරු ද තෝරා ගනු ලැබීය.

පළාත් සභාව මේ රටේ බලතල හා ස්වෛරීභාවයද ආරක්‍ෂා කර ඇති අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් පළාත් සභාවට ලබාදී ඇති මෙම බලතල ජනතාවට පළාත් මට්ටමින් තම අවශ්‍යතාවයන් හඳුනාගෙන ඊට විසඳුම් ද ඔවුන් විසින්ම සොයා ගැනීමට අවස්ථා සලසා තිබීම අතිශයින් වැදගත් බව අතිගරු මහින්ද රාජපක්‍ෂ මැතිතුමා විසින් ප්‍රථම වරට නැගෙනහිර පළාත් සභාව විවෘත කළ අවස්ථාවේ දී ප්‍රකාශ කර ඇත.

සියලුම පක්‍ෂවල නියෝජිත සමුළුවේ අතුරු වාර්තාව අතිගරු ජනාධිපති තුමා වෙත භාරදී ජනාධිපතිතුමා විසින් 13 වන සංශෝධනය මුළුමණින්ම ක්‍රියාත්මක කළයුතු බව ඉල්ලා සිටින අතර, එහි අභ්‍යන්තර ප්‍රයත්නයක් ලෙස අදාල සියලුම පක්‍ෂ අන්තර්ග්‍රහණය කොට අවසාන තීරණය ගන්නා තෙක් උතුරු නැගෙනහිර පළාත් වලට 13 වන සංශෝධනය යෝග්‍ය බව සඳහන් කරන ලදී.

එහෙයින්, මෙම පළාත් සභාව විසින් 13 වන සංශෝධනය ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීමට හෝ බලතල අඩු කිරීමට හෝ කිසිවිට අනුමැතිය හෝ සහයෝගය හෝ ලබා නොදිය යුතු බව කියා සිටිමි. එසේම 13 වන සංශෝධනය ආරක්‍ෂා කර ගැනීමට අවශ්‍ය සියලුම කටයුතු මෙම පළාත් සභාව මගින් ක්‍රියාත්මක කළයුතු බවද ඉල්ලා සිටිමි.

**04 සභාව කල් තැබීම.**

**කේ. කරුනාහරන්**
**සභා ලේකම්**

**2013.09.17**

ශ ❀ ය